**ශීර්ෂය 217- පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව**
**2016 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 217 - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 29 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා වෙත නිකුත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ සහ ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරින්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

දෙපාර්තමේන්තු සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 309.16 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 304.67 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 4.49 ක් හෙවත් සියයට 1.45 ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 290.18 | 286.07 | 4.11 | 1.42 |
| මූලධන | 18.98 | 18.60 | 0.38 | 2.00 |
| **එකතුව** | **309.16** | **304.67** | **4.49** | **1.45** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ වැය විෂයය අංක 21701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 14.50 | 14.50 | 9.00 | 9.88 | 60.00 | 45.67 |

**2.3 විගණන නිරීක්ෂණය**

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමණාකරන විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමණාකරන විගණන වාර්තාවේ ඇතුලත් විගණන නිරික්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් යාවත්කාලීනව පවත්වා නොගැනීම**

දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ඇතත් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය පරිදි යාවත්කාලීන කර නොතිබුණි.

## 3.2 විසර්ජන ගිණුම

-----------------

**වෙනත් වැය විෂයයන් යටතේ වියදම් දැරීම**

**--------------------------------------------------**

පුනරාවර්තන වියදම් වැය විෂයයක් වන අංක 217-1-1-1301 යටතේ දැරිය යුතු එකතුව රු.198,979 ක වාහන නඩත්තු කිරීමේ වියදම් ප්‍රාග්ධන වැය විෂයයක් වන 217-1-1-2003 (වාහන අලුත්වැඩියා හා වැඩිදියුණු කිරීම්) යටතේ දරා තිබුණි.

## 3.3 විගණනයට සාක්ෂි නොවීම

**--------------------------------**

පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ළමුන්ගේ සමාජ ආරක්ෂාව සඳහා වන සැලැස්ම යටතේ මෙම වැය ශීර්ෂයෙන් හා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ අවදානම් තත්ත්වයේ පසුවන දරුවන් වෙනුවෙන් සකස් කළ ආරක්ෂණ සැලසුම් 297 ක් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 10.94 ක් මුදා හැර තිබුණි. එහෙත් අවදානම් තත්ත්වයේ පසුවන දරුවන් වෙනුවෙන් සකස් කල ආරක්ෂණ සැලසුමේ අවශ්‍යතා ඉටු කරනු ලැබුවේ ද යන්න තහවුරු කර ගැනීමට දෙපාර්තමේන්තුවට නිසි ක්‍රමවේදයක් නොතිබුණි. එමෙන්ම ඒ පිළිබඳ පසුවිපරම් කිරීමක් කර ඇති බවත් විගණනයට තහවුරු නොවිණි.

## 3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

**-----------------------------------------**

**වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**------------------------------------**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව 2016 වර්ෂය සඳහා සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 4. කාර්යසාධනය

**-----------------**

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව, ක්‍රියාකාරි සැලැස්ම හා දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රධාන අරමුණුවලට අදාළ කාර්යවලින් බැහැරව ක්‍රියා කිරීම**

**----------------------------------------------------------------------**

ශ්‍රී ලංකා සමාජ පසුබිම තුළ අනාථ, අත්හල හා අසරණ ළමුන්ගේ ද, නීතිමය ගැටළුවලට බඳුන් වූ ළමුන්ගේ ද අයිතිවාසිකම්, පූර්ණ සංවර්ධනය හා ආරක්ෂාව සුරකෙන ලෙස ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රතිපත්ති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම, ඇගයීම යන කටයුතු සම්බන්ධ කර ජාතික යාන්ත්‍රණයක් ලෙස කටයුතු කිරීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර වුවද, 1956 වර්ෂයේ ආරම්භ වූ දෙපාර්තමේන්තුව වර්ෂ 60 ක් ගතවී තිබුණත් ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි විශ්ව ප්‍රඥප්තියට අනුකූලව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ඊට අදාල නීති සම්පාදනය කිරීම 2016 වර්ෂය වන විටත් සිදුකර නොතිබුණි.

**(ආ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

**-------------------------------------------------------**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

**(i)** 2016 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම මඟින් මාවත් වාසී දරුවන් සඳහා සුභසාධන වැඩසටහන් පැවැත්වීමට රු. 500,000 ක ප්‍රතිපාදන සලසා තිබුණ අතර, වර්ෂය තුල ඊට අදාල වැඩසටහන් 15 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබුණි. මෙම ප්‍රතිපාදිත මුදල සම්පූර්ණයෙන්ම වැය කර සමාලෝචිත වර්ෂයේ දී වැඩසටහන් 05 ක් පමණක් පවත්වා තිබුණි. එකී වැඩසටහන් පැවැත් වූ බවට වියදම් වාර්තා සහ ප්‍රගති වාර්තා දෙපාර්තමේන්තුව වෙත ගෙන්වා ගෙන නොතිබූ බැවින්, අදාල වැඩසටහන් පැවැත් වූ බවට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිණි.

**(ii)** සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලියාපදිංචි ළමා සමාජ සංඛ්‍යාව 4,027 ක් විය. ළමා සභා පිහිටුවීම, පවත්නා ළමා සමාජ ක්‍රියාකාරිව පවත්වා ගෙන යෑම හා ප්‍රතිසංවිධානය සඳහා රු.මිලියන 3.4 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට ලබා දී තිබුණි. එසේ වුවද, ළමා සමාජ අඛණ්ඩව ක්‍රියාකාරිව පවත්වා ගෙන යා හැකි පරිදි සකස් කළ සුදුසු වැඩසටහන් හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන් මෙහෙයවා නොතිබුණි.

**(iii)** සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුව වෙත වාර්තා වූ ළමා අපයෝජන 11,054 කින් පැමිණිලි 7,031 ක් සඳහා පමණක් පූර්ණ කාලීන විසඳුම් ලබා දී තිබුණි. පැමිණිලි 2,419 ක් සඳහා කෙටිකාලීන විසඳුම් ලබා දී තිබුණු අතර, පැමිණිලි 58 ක් සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි. පැමිණිලි 1,551 ක් විසඳුම් සඳහා වෙනත් ආයතන වෙත යොමු කර තිබුණි. එහෙත් එම දරුවන්ගේ පැමිණිලි සඳහා ලබා දුන් විසඳුම් පිළිබඳ දෙපාර්තමේන්තුව පසුවිපරම් කර නොතිබුණි.

**(iv)** දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ පර්යේෂණයන් 3 ක් වෙනුවෙන් රු. මිලියන 4.98 ක් වැය කර තිබූ නමුත්, එම පර්යේෂණ වාර්තාවලින් ලබා ගත් නිර්දේශ හා නිගමන ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් පරිදි වැඩසටහන් / ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

**5. මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-------------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 6 | 3 | 3 |
| (ii) | තෘතියික මට්ටම | 238 | 234 | 4 |
| (iii) | ද්විතියික මට්ටම | 226 | 195 | 31 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17 | 12 | 5 |
| | **එකතුව** | **487** | **444** | **43** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 43 ක් පැවති අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 3 ක් පැවතිම නිසා සැලැසුම් සකස් කිරීම හා අධීක්ෂණ කටයුතු නිසියාකාරව සිදු නොවීමත්, ද්විතියික මට්ටමේ තනතුරු 31 ක පුරප්පාඩු පැවතීම නිසා සැලසුම් ක්‍රියාත්මක කිරිමේ අඩුපාඩුද නිරීක්ෂණය විය.